Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2019-04-04

පැමිණිලි පාර්ශවය :- ඩී.එම් අශෝක ධර්මරත්න මයා.
කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර.
කරමැටිය ගොවිජන සේවා මධ්‍යස්ථානය.
මීගහකිවුල.

වගඋත්තරකරුවන් :-

1. ස්ථානාධිපති.
119 හදිසි ඇමතුම් ඒකකය.
මිරිහාන.

2. එච්.එම්.සී.සී හේරත් මයා.
ස්ථානාධිපති.
පොලිස් ස්ථානය.
කන්දකැටිය.

3. උ.පො.ප සමන් බණ්ඩාර මයා.
පොලිස් ස්ථානය.
කන්දකැටිය.

4. පො.කො 35834 බණ්ඩාර මයා.
පොලිස් ස්ථානය.
කන්දකැටිය.

5. පො.කො 85073 හේවාසිංහ මයා.
පොලිස් ස්ථානය.
කන්දකැටිය.

<u>පැමිණිලි අංකය : **HRC/BD/217/14**</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරයෙකු වන තමාට 2014 වර්ෂයේ


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrc@sltnet.lk

කෘෂිකර්ම සංගණනයේදී කරඳගහමඩ ග්‍රාම නිලධාරී වසම තුළ සෑම නිවසකින්ම විස්තර ලබා ගැනීමට නියමිතව තිබූ බවත්. 2014.08.19 දින එසේ සංගණනයේ යෙදී සිටියදී මීගහඅරාව කරඳගහමඩ ලිපිනයේ පදිංචි ආර්. රොබට් යන අයගේ නිවසට ගිය විට එම අය බීමතින් අසභ්‍ය වචනයෙන් බැණ වදිමින් පහරදීමට උත්සහ කළ බවත් ඒ අනුව තමාගේ රාජකාරියට බාදා කිරීම පිළිබඳව 119 පොලිස් හදිසි ඇමතුම් ඒකකයට හා කන්දකැටිය පොලිස් ස්ථානය වෙත පැමිණිලි කළ බවත්. නමුත් කන්දකැටිය පොලිසියේ නිලධාරීන් විසින් සිය රාජකාරිය පැහැරහැරි බවත් සඳහන් කර ඇත. 2014.08.20 දින තමාට පහරදීමට උත්සහ කළ ආර්. රොබට් යන අය විසින් ඔහුට අශෝක ධර්මරත්න නැමැති තමා විසින් පහරදුන් බවට සඳහන් කරමින් මහකිවුල රෝහලට ඇතුළත්ව කර ඇති පැමිණිල්ලකට අනුව කන්දකැටිය පොලිස් නිලධාරීන් ක්‍රියාත්මක වී අශෝක ධර්මරත්න වන තමාව අත්අඩංගුවට ගත් බවත් මෙම ක්‍රියාව හේතුවෙන් තමාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවටත් දක්වා ඇත. ඒ අනුව ඉහත වගඋත්තරකරුවන්ට එරෙහිව අපක්ෂපාතී පරීක්ෂණයක් පවත්වා සාධාරණය ඉටු කරදෙන ලෙස ඉල්ලා සිට ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

මීට අදාළව දෙවන වගඋත්තරකාර කන්දකැටිය පොලිස් ස්ථානාධිපතිවරයා විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ. 2014.08.19 දින 119 ඇමතුම් අංකය මඟින් පැය 16.50 ට ඇමතුමක් ලබා දෙමින් ධර්මරත්න යන අයට බීමත් පුද්ගලයෙකු හිරිහැර කරන බවට දන්වා ඇති බවත් ඒ අනුව පො.කො 35834 බණ්ඩාර හා පො.කො 85073 හේවාසිංහ යන නිලධාරීන් විමර්ශනය සඳහා පිටව ගොස් ඇතත් සිදුවීම සම්බන්ධව තොරතුරු අනාවරණය කර ගැනීමට නොහැකි වූ බවත්ය.

2014.08.20 දින මීගහකිවුල දිසා රෝහලේ දිසා වෛද්‍ය නිලධාරියා විසින් මීගහඅරාව ගෙදර කුඹුර ලිපිනයේ. රොබට් නැමැති අයකු පහරකෑමට ලක්ව අංක 01 වාට්ටුවේ ඇතුළත් කර ප්‍රතිකාර ලබන බව දන්වා ඇති බවත් ඒ අනුව කන්දකැටිය පොලිස් ස්ථානයේ පොලිස් පරීක්ෂක සමන් බණ්ඩාර නිලධාරියා මීගහකිවුල රෝහලට ගොස් රාමන් රොබට් යන අයගෙන් ප්‍රකාශයක් සටහන්කර ඇති අතර එහිදී මෙම කොමිසම වෙත පැමිණිලිකර ඇති ඩී.එම් අශෝක ධර්මරත්න විසින් රාමන් රොබට් යන අයට පහරදීමෙන් ප්‍රතිකාර ලබන බව අනාවරණය කර ගැනීමෙන් පසු සිදුකරන ලද විමර්ශනය අනුව ඩී.එම් අශෝක ධර්මරත්න යන අය 2014.08.30 දින පෙ.ව 10.55 ට අත්අඩංගුට ගෙන පැය 13.30 ට පොලිස් ඇප මත මුදාහැර විමර්ශනය අවසන් කර දෙපාර්ශවය මීගහකිවුල සමථ මූල මණ්ඩලය වෙත යොමු කිරීමෙන් පසු එහිදී දෙපාර්ශවය සමථ වූ බවත් දක්වා ඇත.

2014.08.31 දින මෙහි පැමිණිලිකාර ඩී.එම් අශෝක ධර්මරත්න විසින් කරඳගහමඩ මීගහඅරාව ලිපිනයේ ආර්. රොබට් යන අයට විරුද්ධව ප්‍රකාශයක් කරමින් 2014.08.19 දින ආර්ථික සංගණනය සඳහා ගිය අවස්ථාවේදී තම රාජකාරියට බාදා කළ බවට කරන ලද ප්‍රකාශයට අනුව විමර්ශනයක් පවත්වා ආර්. රොබට් යන අයට විරුද්ධව බදුල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 82786 යටතේ අධිකරණයේ පැමිණිල්ලක් ගොනුකර ඇති බවත් එම පැමිණිල්ල බදුල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ 2015.04.22 දිනට කැඳවීමට නියමිත බවත්. සඳහන් කර ඇත.

119 හදිසි ඇමතුම් අංශයට කරන ලද පැමිණිල්ල පිළිබඳ සවිස්තරාත්මක පිළිතුරක් සපයමින්. කන්දකැටිය පොලිස් ස්ථානයේ එදින රාජකාරී නියුතුව සිටි පො.කො 35834 බංඩා ඇතුළු නිලධාරී කණ්ඩායම විසින් පරීක්ෂා කිරීම සිදුකළ බවත්, පැමිණිලිකරු හමු නොවූ බවත් එවැනි පුද්ගලයින් කිසිවෙකුද හමු නොවූ බවත් හා මේ සම්බන්ධව විමර්ශනය පසුව සිදුකරන බවට පිළිතුරු පණිවිඩයක් ලබා දී ඇති බවට ගොනුව ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත.

මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-

ඉහත මෙම පරීක්ෂාව සිදුකළ පො.කො 35834 බණ්ඩාර හා පො.කො 85073 හේවාසිංහ යන නිලධාරීන් කොමිෂන් සභාව වෙත කැඳවා විමර්ශනයට ලක් කර ඇති අතර එහිදී පැමිණිලි පාර්ශවය විසින් කරන ලද පැමිණිල්ල පිළිබඳවත් මෙම සිද්ධිය සබැඳිවම කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් විසින් 2014.08.27 දාතමින් කන්දකැටිය පොලිස් ස්ථානාධිපති වෙත යොමුකළ ලිපිය පිළිබඳවත් නිසි අවධානයක් යොමු කිරීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ. එසේම පැමිණිලිකරු විසින් 2014.08.31 දින උක්ත කරුණු සබැඳිව කන්දකැටිය පොලිස් ස්ථානය වෙත කර ඇති පැමිණිල්ල 2014.09.28 දින විමසීම් සිදුකර 2014.11.11 දින අධිකරණය වෙත යොමුකර ඇති බව අනාවරණය වී ඇත. එසේම අශෝක ධර්මරත්න යන රාජ්‍ය නිලධාරියාගේ රාජකාරියට බාදා කළායැයි සඳහන් ආර්. රොබට් යන අය විසින් කන්දකැටිය පොලීසිය වෙත කළ පැමිණිල්ලට ක්ෂණිකව පොලිස් නිලධාරින් ක්‍රියා කර ඇති බව අනාවරණය වේ.

එසේම කන්දකැටිය පොලිස් ස්ථානය වෙත පැමිණිලිකාර අශෝධ ධර්මරත්න යන අයගේ පැමිණිල්ල ලද මොහොතේම කන්දකැටිය පොලිස් ස්ථානයේ අදාළ නිලධාරීන් ක්‍රියාත්මක වී ක්‍රියා කළේ නම්. ආර්. රොබට් යන අය බීමතින් සිට රාජකාරියට බාදා කළේදැයි යන්න තහවුරු කර ගැනීමට අවස්ථාව තිබූ නමුත් එසේ නොකිරීමෙන් රජයේ නිලධාරියෙකුට පොලීසියෙන් ලැබිය යුතු සේවය අහිමි වී ගොස් ඇති බවත්. අනාවරණය වේ.

එසේම මෙම පරීක්ෂණයේදී කන්දකැටිය පොලිස් ස්ථානයේ උ.පො.ප සමන් බණ්ඩාර යන නිලධාරියා විසින් ආර්. රොබට් අයට පක්ෂව ක්‍රියා කළ බවටද පැමිණිල්ල මඟින් කරුණු දක්වා ඇත. ඒ මත කන්දකැටිය පොලිස් ස්ථානයේ උ.පො.ප සමන් බණ්ඩාර නිලධාරීන් වෙතින් ප්‍රකාශ සටහන් කර ගැනීමේදී සඳහන් කර ඇත්තේ. 'ආර්. රොබට් යන අය මීගහකිවුල දිසා රෝහලේ පහරකෑමට ලක්ව ප්‍රතිකාර ලබන බවට එහි වෛද්‍යවරයාගෙන් ලද පණිවිඩයකට අනුව එහි ගොස් ප්‍රකාශ ලබා ගත් බවත්. ඒ අනුව දෙපාර්ශවය පොලිස් ස්ථානය වෙත කැඳවා පරීක්ෂා කළ බවත්. දෙපාර්ශවය එකඟතාවයකට නොපැමිණී බැවින් අශෝක ධර්මරත්න යන අය අත්අඩංගුවට ගෙන පොලිස් ඇප මත නිදහස් කර සමථ මණ්ඩලය වෙත යොමු කළ බවත් හා අශෝක ධර්මරත්න යන අයගේ පැමිණිල්ලට අදාළව ඔහුගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට ප්‍රමාදවීම හේතුවෙන් අශෝක ධර්මරත්න කළ පැමිණිල්ලේ රාජකාරී කටයුතු ප්‍රමාද වූ බවත්'ය.

නිරීක්ෂණ :-

පැමිණිල්ලේ දක්වා ඇති පරිදි තම රාජකාරියට ආර්. රොබට් යන අය විසින් බාදා පමුණුවන ලද බවට 119 අංකය වෙත 2014.08.19 දින පැය 16.35 ට පැමිණිලි කිරීමෙන් පසු පො.කො 67689 බාලසූරිය නිලධාරියා විසින් පැය 16.44 පො.කො 3927 නිලධාරියා වෙත බැහැර කර ඇති බව එම පණිවිඩය පො.කො 25934 බංඩා ඇතුළු නිලධාරීන් කණ්ඩායම විසින් පරීක්ෂා කළ බවට හා පැමිණිලිකරු හමු නොවූ බවට 119 වෙත සපයා ඇති වාර්තාව හා පො.කො 35834 එච්.එම්.යූ.සී.ජ් බංඩාර හා පො.කො 85073 හේවාසිංහ යන නිලධාරීන් විසින් ලබා දී ඇති ප්‍රකාශ අනුවත්. 119 ඇමතුම් ක්‍රියාමාර්ග පෝරමය මගින් විස්තර කරනු ලබන පණිවුඩය. ලැබූ දිනය 2014.08.19 වේලාව 16.48 වන අතර. සිද්ධිය සිදුවූ ස්ථානයට නිලධාරීන් දෙපල 2014.08.19 වේලාව 16.55 පැයට ගිය බවට දක්වා ඇත. නමුත්. අදාළ නිලධාරීන්ගේ ප්‍රකාශ තුළ ඔවුන් වෙත කන්දකැටිය පොලිස් ස්ථානයේ 119 පණිවුඩය ලැබෙන විට ගලඋඩ ප්‍රදේශයේ වෙනත් රාජකාරියක් සිදුකළ බවත්. ආපසු ඉහත පණිවුඩය පිළිබඳව කරඳගහමඩ යන විට ප.ව 6.45 - 7.00 අතර වේලාවක් වූ බවටත් එවිට කිසිවෙකු නොසිටි බවටත් වන සඳහන් කිරීමත් තුළින් ඉහත නිලධාරීන් අසත්‍ය තොරතුරු සපයා ඇති බව කොමිෂන් සභාව හමුවේ නිරීක්ෂණය වේ.

තවද මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් විසින් 2014.08.27 දාතමින් කන්දකැටිය පොලිස් ස්ථානාධිපති වෙත සංගණන රාජකාරිය සඳහා බාදා කිරීම යන මැයෙන් යොමුකර ඇති ලිපියට අනුවත්. පැමිණිලිකාර ඩී.එම් අශෝක ධර්මරත්න මහතා විසින් 119 පැමිණිල්ලට අමතරව 2014.08.31 දාතමින් කන්දකැටිය පොලිස් ස්ථානය වෙත කර ඇති පැමිණිල්ල පිළිබඳවත් රාජකාරී ඉටු කිරීම වැළැක්වීම සඳහා රජයේ සේවකයෙකුට සාපරාධී බලහත්කාරය පෑම යටතේ රාමන් රොබට් යන අයට එරෙහිව බදුල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 82786 දරණ නඩුව 2014.11.12 දින ගොනු කිරීමෙන් කන්දකැටිය පොලිස් ස්ථානාධිපති ඇතුළු අදාළ නිලධාරීන් විසින් සාධාරණ කාලයක් තුළ නඩු ගොනු කිරීමට ක්‍රියා කර නොමැති බව නිරීක්ෂණය වේ.

එසේම අශෝක ධර්මරත්න යනඅය විසින් පහරදුන් බව සඳහන් කරමින් 2014.08.20 දින මීගහකිවුල රෝහලට ඇතුළත්ව කන්දකැටිය පොලීසිය වෙත කර ඇති පැමිණිල්ල සබැඳිව කන්දකැටිය පොලිස් ස්ථානාධිපති ඇතුළු නිලධාරීන් එම පැමිණිල්ල විභාග කර කඩිනමින් සමථ මණ්ඩලය වෙත යොමු කර ඇති වග හා මීගහකිවුල සමථ මණ්ඩලය විසින් යොමු අංක 76/3466 යටතේ 2014.09.13 දාතමින් අශෝක ධර්මරත්න මහතා කැඳවා ඇති සමථ මණ්ඩල කැඳවීමේ නිවේදනයෙන් නිරීක්ෂණය වේ. නමුත් පැමිණිලිකරු විසින් 119 හදිසි ඇමතුම් අංශයට පැය 16.35 ට ඉදිරිපත් කර ඇති පැමිණිල්ල පැය 16.44 ට මුදා හැර ඇති අතර අදාළ නිලධාරීන් සිද්ධිය සිදුවූ ස්ථානයට ගොස් ඇත්තේ පැය 6.45 ත් 7 ත් අතර කාලයේදීය. ඒ අනුව ක්‍රියාත්මක වීමේදී සිදුවූ ප්‍රමාදය හේතුවෙන් පැමිණිලිකරුට අගතියක් වී ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව නීතිය ක්‍රියාත්මක කිරීමේදී පැමිණිලිකාර අශෝක ධර්මරත්න මහතා වෙත එක් ආකාරයකටත්. ආර්. රොබට් යන අය වෙත වෙනත් ආකාරයකටත් අසමාන අන්දමින් ක්‍රියාකර ඇති බව නිරීක්ෂණය වේ.

ඉහත සියළු කරුණු සලකා බැලීමේදී පැමිණිලිකාර ඩී.එම් අශෝක ධර්මරත්න මහතා විසින් කරන ලද පැමිණිල්ලේ කරුණු සනාථ වන බැවින් පැමිණිලිකාර ඩී.එම් අශෝක ධර්මරත්න මහතාට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට ඇති නීතියේ සමාන රැකවරණය ලැබීමට ඇති මූලික අයිතිය උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. ඒ අනුව දෙවන වගඋත්තරකාර ස්ථානාධිපති, පොලිස් ස්ථානය කන්දකැටිය විසින් පැමිණිලිකරු වෙත රු. 2,000/ ක මුදලක්ද, තුන්වන වගඋත්තරකාර උ.පො.ප සමන් බණ්ඩාර නිලධාරියා විසින් රු. 2,000/- ක මුදලක්ද, සිවුවන හා පස්වන වගඋත්තරකාර පො.කො 35834 බණ්ඩාර සහ පො.කො 580730 හේවාසිංහ යන නිලධාරීන් විසින් රු. 2,000/- ක මුදලක්ද ලෙස වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු වෙත වන්දි වශයෙන් රු. 6,000/- ක මුදලක් ගෙවිය යුතුය.

02. වගඋත්තර පාර්ශවය සම්බන්ධයෙන් නිසි විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙත සහ නීතිපතිවරයා වෙතද යොමුකරනු ලැබේ.

2019.05.10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
Human Rights Commission of Sri Lanka
R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- 1. සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07.

2. පොලිස්පති,
පොලිස් මූලස්ථානය, කොළඹ 01.

3. අධ්‍යක්ෂ,
පොලිස් නීති කොට්ඨාශය,
පොලිස් මූලස්ථානය, කොළඹ 01.
- ඉහත වගඋත්තරකරුවන්ගේ වර්ථමාන සේවා ස්ථානය සොයා බලා නිර්දේශය යොමු කිරීමට

B/